
## ගැටලු අංක 15
**2017-i-24**

ගැලීම් සටහනක් භාවිතයෙන් විස්තර කර ඇති පහත දැක්වෙන ඇල්ගොරිතමය සලකන්න:





ගැලීම් සටහනෙහි ආදාන (inputs) ලෙස X=10 හා Y=20 ලබා දුන්නේ නම්, අනුපිළිවෙළින් X හා Y සඳහා දර්ශනය කරනු (display) ලබන අගයන් මොනවා ද?

(1) 10, 10 (2) 10, 20
(3) 20, 10 (4) 20, 20

## ගැටලු අංක 16
**2017-ii-7(i)**

සංඛ්‍යා දෙකක් කියවා කුඩා සංඛ්‍යාව දර්ශනය කිරීම සඳහා වන ඇල්ගොරිතමයක් පහත ගැලීම් සටහනෙහි ඉදිරිපත් කර ඇත.





ගැලීම් සටහනෙහි දක්වා ඇති ඇල්ගොරිතමය සඳහා අදාළ ව්‍යාජ කේතය (pseudocode) ලියා දක්වන්න.


LIVEWORKSHEETS

## ගැටලු අංක 17
## 2019-ii-1(viii)

පහත දක්වා ඇති ගැලීම් සටහනෙහි විෂය තුනක ලකුණු ආදානය කරයි. අනතුරු ව එම ලකුණුවල සාමාන්‍ය අගය ගණනය කර, සංදර්ශනය කරනු ලබන අතර, සමත්/අසමත් බව ද සංදර්ශනය කරයි. සාමාන්‍ය අගය 40ට සමාන හෝ වැඩිවීම සමත් සේ සලකනු ලබයි.

ගැලීම් සටහනෙහි Ⓟ, Ⓠ, Ⓡ, Ⓢ ලේබල මගින් දක්වා ඇති ස්ථාන සඳහා යෙදිය යුතු නිවැරදි වගන්ති පහත පෙන්වා ඇති වගුවෙන් හඳුනාගන්න. එක් එක් ලේබලය හා ගැළපෙන වගන්තියේ අංකය ලියා දක්වන්න.




| වගන්තියේ අංකය | වගන්තිය |
|---|---|
| 1 | average = (m1+m2+m3)/3 |
| 2 | "Fail" සංදර්ශනය කරන්න. |
| 3 | "Pass" සංදර්ශනය කරන්න. |
| 4 | average < 40 ද? |



LIVEWORKSHEETS

### ගැටලු අංක 18
### 2017-i-28

පහත සඳහන් ව්‍යාජ කේතය සලකන්න:

```
if average>70 then
    if Sport_colour = 'True' then
        Allrounder_award = 'True'
    endif
endif
```

ඉහත දක්වා ඇති ව්‍යාජ කේතයේ තර්කයට පහත සඳහන් කවරක් තුල්‍ය වේ ද?

(1) average>70 AND Sport_colour = 'True' නම්, එවිට Allrounder_award = 'True' වේ.
(2) average>70 OR Sport_colour = 'True' නම්, එවිට Allrounder_award = 'True' වේ.
(3) average>70 නම්, එවිට Allrounder_award = 'True' වේ.
(4) Sport_colour = 'True' නම්, එවිට Allrounder_award = 'True' වේ.

### ගැටලු අංක 19
### 2018-i-35

පහත සඳහන් ව්‍යාජ කේත (pseudocode) කොටස සලකන්න:

```
Payment_option = 'False'
IF distance > 100 THEN
    Payment_option = 'True'
    IF vehicle_type = 'Bus' THEN
        Payment_option = 'False'
    ENDIF
ENDIF
```

ඉහත ව්‍යාජ කේතයට අනුව පහත සඳහන් කුමන වගන්තිය නිවැරදි වන්නේ ද?

(1) distance = 99 හා vehicle_type = 'Car' වන විට Payment_option 'True' ලෙස වේ.
(2) distance = 99 හා vehicle_type = 'Bus' වන විට Payment_option 'True' ලෙස වේ.
(3) distance = 101 හා vehicle_type = 'Bus' වන විට Payment_option 'False' ලෙස වේ.
(4) distance = 101 හා vehicle_type = 'Car' වන විට Payment_option 'False' ලෙස වේ.



LIVEWORKSHEETS

## ගැටලු අංක 20
## 2018-i-38

දකුණුපස පෙන්වා ඇති ගැලීම් සටහන සලකන්න. එය ආදානය කරනු ලබන සංඛ්‍යාව 0 සහ 100 අතර වන්නේ නම් 'වලංගු ලකුණකි' යන්න පෙන්වයි.


Ⓟ, Ⓠ හා Ⓡ ලේබල සඳහා ලිවිය යුතු පද පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) N<=100, නැත, ඔව්

(2) N<=100, ඔව්, නැත

(3) N=100, නැත, ඔව්

(4) N=100, ඔව්, නැත




## ගැටලු අංක 21
## 2019-i-39

පහත පෙන්වා ඇති ව්‍යාජ කේතය සලකා බලන්න.

```
READ a, b, c
value = 0
IF (a>b) THEN
        IF (a>c) THEN
                value = a
        ELSE
                value = c
        ENDIF
ENDIF
DISPLAY value
```

a, b හා c යන විචල්‍ය සඳහා පිළිවෙළින් 50, 30 හා 70 යන අගයයන් ආදානය කරනු ලබයි නම්, දර්ශනය කෙරෙන ප්‍රතිදානය කුමක් ද?

(1) 0 (2) 30 (3) 50 (4) 70



LIVEWORKSHEETS